මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PE/2024/58**

**2024.11.06**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

### රාජ්‍ය හා පෞද්ගලික බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024.11.02 දිනැති අංක PE/2024/52 දරන මාධ්‍ය නිවේදනයට වැඩිමනත් වශයෙනි.

තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවානියුක්තිකයන්ට නිවාඩු දීමට සේවායෝජකයන් කටයුතු කළ යුතු බවට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 122 වැනි වගන්තිය අනුව විධිවිධාන සලසා ඇති අතර 2024.11.14 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

මේ සම්බන්ධයෙන් මාධ්‍ය මඟින් සියලුම සේවායෝජකයින් දැනුවත් කර ඇතත් සමහර බැංකු හා වෙනත් මූල්‍ය ආයතනවල සේවකයන්ට නිවාඩු ලබාදීම නිසි පරිදි සිදු නොවන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී තිබේ.

ඒ අනුව සියළුම රාජ්‍ය හා පෞද්ගලික බැංකු හා වෙනත් මූල්‍ය ආයතනයන් හි සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට මෙම ඡන්ද විමසීමේ දී ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්ද පොලට යෑමට ප්‍රමාණවත්වන සේ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලබා දීමට ක්‍රියා කරන ලෙස අදාළ ආයතන ප්‍රධානීන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්